# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1972/33 - 2016 ජුනි මස 22 වැනි බදාදා - 2016.06.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවැරදි කිරීමයි

**මෝටර් වාහන පනත (203 වැනි අධිකාරය)**

අංක 1939/4 සහ 2015 නොවැම්බර් මස 02 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 අංක 01 දරන මෝටර් වාහන (රියදුරු පාසල්, රියදුරු උපදේශක සහ සහකාර රියදුරු උපදේශක) නියෝගයන්හි සිංහල හා දෙමළ භාෂා පිටපත් වල ඇති මුද්‍රණ දෝෂ පහත පරිදි නිවැරදි විය යුතු අතර එම දෝෂ නිවැරදි කිරීම සඳහා පළ කරන ලද 1963/36 හා 2016.04.22 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මෙයින් අවලංගු කරනු ලැබේ.

අංක 1939/4 සහ 2015 නොවැම්බර් මස 02 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 අංක 01 දරන මෝටර් වාහන (රියදුරු පාසල්, රියදුරු උපදේශක සහ සහකාර රියදුරු උපදේශක) නියෝගයන්හි සිංහල භාෂාවේ 6A පිටුවෙහි II වැනි කොටසේ 14 වැනි වගන්තියේ ඈ උපවගන්තිය පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය.

''14(ඈ) රාජ්‍ය ආයතනයක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ වෙනත් එවැනි ආයතනයක පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටින තැනැත්තෙකු හැර ඔහු හෝ ඇය එවැනි ආයතනයක සේවා නියුක්තිකයෙකු නොවිය යුතුය.''

දෙමළ භාෂා මුද්‍රණයේ 8A පිටුවෙහි 14 වගන්තියේ (ඈ) උපවගන්තිය පහත පරිදි ඇතුළත් විය යුතුය.

14(ඈ) ''රාජ්‍ය ආයතනයක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ වෙනත් එවැනි ආයතනයක පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටින තැනැත්තෙකු හැර ඔහු හෝ ඇය එවැනි ආයතනයක සේවා නියුක්තිකයෙකු නොවිය යුතුය.''

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2016 ජුනි මස 21 වැනි දින.

07 - 375


1A - G 23685 — 507 (2016/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*